(හයවැනි පාර්ලිමේන්තුව —තෙවැනි සභාවාරය)

අංක. 22]

# පාර්ලිමේන්තුවේ න්‍යාය පත්‍රය

## 2008 සැප්තැම්බර් මස 12 වැනි සිකුරාදා පූ. භා. 9.30 ට

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

0048/'08

1.

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) හොටෙල් ඩිවලොපර්ස් (ලංකා) ලිමිටඩ් (HDL) සමාගමට අයත් හිල්ටන් හෝටලය පිහිටා ඇති අක්කර 7කට වැඩි ඉඩම 1999 ජූලි මස විශේෂ ප්‍රදාන අංක 673 සහ 674 පවරාදීමට අනුව රජය වෙත පැවරී තිබෙන බව; හා

(ii) මෙම ඉඩම නැවත රජය වෙත පවරා තිබෙන බව;

එතුමා දන්නෙහිද?

(ආ) (i) 1999 ජූලි මස සිට මෙම ඉඩම පරිහරණය වෙනුවෙන් HDL සමාගම විසින් ගෙවූ මුදල කොපමණද;

(ii) මුදල් ගෙවනු නොලැබුවේ නම්, එම පහසුකම සෙසු අයටත් ලබා දෙන්නේද;

(iii) HDL සමාගම බංකොලොත්වී ඇති බැවින් එය විසුරුවා හැරීම සඳහා අයදුම්පත්‍රයක් ගොනුකර තිබේද;

(iv) 2007 මැයි මස 03 වැනි දිනෙන් පසු HDL සමාගම විසුරුවා හැරීමට අමාත්‍ය මණ්ඩලය විරුද්ධ වී තිබේද;

(v) එසේ නම්, 2007 අංක 7 දරන සමාගම් පනත අනුව රජයේ ණය සඳහා වන හිඟය, ආපසු රජයට ගෙවීමේ වගකීම පුද්ගලිකව අමාත්‍ය මණ්ඩලය බාර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0051/'08

2.

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2001 වසරේ සිට අද දක්වා රජය විසින් ලබා ගෙන ඇති දේශීය ණය සහ විදේශීය ණය වල සමස්ත වටිනාකම වාර්ෂිකව කොපමණද;

(ii) පොලී අනුපාතය සහ ආපසු ගෙවීමේ කාල සීමාව කොපමණද;

(iii) මෙකී ණය මුදල් ලබා ගැනීමේ හේතුව කවරේද;

(iv) අද දිනට පවතින, ජාතියේ දේශීය ණය සහ විදේශීය ණය වල සමස්ත වටිනාකම කොපමණද;

(v) මෙකී ණය මුදල් ආපසු ගෙවිය යුතු දිනය කවදාද;

(vi) ගෙවිය යුතු මුළු පොලිය සහ එකී පොලී මුදල ගෙවා දැමිය යුතු දිනයන් කවරේද; සහ

(vii) වසර 2001 සිට අද දක්වා පොලී පිරිවැය ප්‍රමාණය වාර්ෂිකව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත සඳහන් කළ පරිදි ආපසු ගෙවිය යුතු මුදල (මුල් මුදල සහ පොලී එකතුව) කොපමණද; සහ

(ii) වාර්ෂිකව ආපසු ගෙවිය යුතු සමස්ත මුදල කොපමණද;

යන්න පිළිබඳ කරුණු සියල්ල අඩංගු උපලේඛනයක් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) මෙම ණය ආපසු ගෙවීම සිදුකිරීමට යන්නේ කුමන ඉපැයීම් තුළින්දැයි එතුමා ප්‍රකාශ කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0062/'08

3.

ගරු රවි කරුණානායක මහතා,—මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාර්ලිමේන්තුවේ පරිපූරක ඇස්තමේන්තු තුළින් සම්මත නොකර ජාතික අයවැය දෙපාර්තමේන්තුව හරහා අරමුදල් ප්‍රතිපාදනය කිරීමට මහා භාණ්ඩාගාරයේ ලේකම්වරයාට බලය ලබා දෙන 6 වැනි වගන්තියක් 2005 සහ 2006 විසර්ජන පනත්කෙටුම්පත් මගින් හඳුන්වා දෙනු ලැබූ බවත්;

(ii) ඒ මගින් රාජ්‍ය මූල්‍ය සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ උත්තරීතරභාවය රහසිගතව අත් කර ගැනීමක් සහ හීන කිරීමක් සිදුවන බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ආ) ඉහත කී වගන්තියේ විධිවිධාන භාවිතා කරමින් මුදල් අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් 2006 සහ 2007 වර්ෂවලදී ප්‍රතිපාදන කරන ලද මුදල් ප්‍රමාණයන් කොපමණද යන්න එතුමා මෙම සභාවට වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) (i) එම මුදල් භාවිතා කරන ලද්දේ කවර කාර්යයක් සඳහාද;

(ii) එහි වැය ශීර්ෂ අංකය සහ විශේෂිත ව්‍යාපෘති කේතය අදාළ විස්තරයක් සමඟ කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0156/'08

4.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, නිවාස සංවර්ධනය සඳහා සහායක වැඩසටහන් ලෙස රුපියල් මිලියන 198 ක් වෙන්කර තිබූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂය වෙනුවෙන් වියදම් කළ මුදල කොපමණද;

(ii) එම මුදල් යොදවා සිදු කළ ව්‍යාපෘති කවරේද;

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0157/'08

5\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නිවාස හා පොදු පහසුකම් අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) 2007 වර්ෂයේ ප්‍රතිශෝධිත අයවැය (අයවැය ඇස්තමේන්තුව 2008 සඳහන් පරිදි) මගින්, තෝරා ගත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 119 ක් තුළ එක් ගමකට ගෙවල් 25 බැගින් ඉදිකිරීමේ ව්‍යාපෘතිය සඳහා රුපියල් මිලියන 600 ක් වෙන්කර තිබූ බව එතුමිය දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2007 වර්ෂයේ ඒ සඳහා වියදම් කළ මුදල කොපමණද;

(ii) ව්‍යාපෘති සිදුකළ ගම් කවරේද;

(iii) ප්‍රතිලාභීන් සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0158/'08

6\.

ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 2006 වර්ෂයේ අයවැය ඇස්තමේන්තුවෙන්, ලුනාව පරිසර හා ප්‍රජා සංවර්ධන ව්‍යාපෘතිය වෙනුවෙන් රුපියල් 1,110,923,000 ක් වෙන්කර තිබූ බව එතුමා දන්නෙහිද?

(ආ) (i) ඒ අනුව, 2006 වර්ෂය සඳහා වියදම් කළ මුදල කොපමණද;

(ii) ඒ කවර වැඩ කටයුතු සඳහා ද;

යන්න වෙන් වෙන් වශයෙන් එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0356/'08

7\.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—ජාතික ගොඩනැඟීමේ සහ වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පිලිමතලාව, මොලදණ්ඩ, මැද්දේගොඩේ ගෙදර වත්ත, අංක 96/2 ලිපිනයෙහි පදිංචි එන්. වයි. විමලදාස මහතා 1960 වසරේ සිට උඩරට ගැමි කොමිෂන් සභාවේ කම්කරුවෙකු ලෙස සේවය කළ බවත්;

(ii) 1987 වසරේදී රෝලර් රියදුරෙකු වශයෙන් විශ්‍රාම ගන්වන ලද බවත්;

(iii) මොහුට විශ්‍රාම වැටුප හිමිව ඇත්තේ 1977 සිට 1987 දක්වා දස අවුරුදු සේවා කාලයකට පමණක් බවත්;

එතුමා දන්නෙහිද?

(ආ) මොහු මෙම ආයතනයේ සේවය කළ 1960 සිට 1977 අතර කාලසීමාවට අදාළව විශ්‍රාම වැටුප් ගණනය නොකළේ කවර හේතුවක් නිසාද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) 1960 සිට 1987 දක්වා වන මොහුගේ අඛණ්ඩ සේවා කාලය සැලකිල්ලට ගෙන මොහුගේ සම්පූර්ණ විශ්‍රාම වැටුප ලබා දීමට එතුමා අවශ්‍ය කටයුතු කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0357/'08

8.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,—ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) මිනිපේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ උඩවෙල ජනපද නිලධාරි කොට්ඨාසයේ බරවර්ධනඔය උප තැපැල් කාර්යාලය පිහිටි රජය සතු ඉඩමේ කොටසක් පෞද්ගලික අයෙකු අනවසරයෙන් වැටකඩොලු බැඳ භුක්ති විඳින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) බරවර්ධනඔය එක්සත් සුභ සාධන හා මරණාධාර සමිති ශාලාවක් ඉදිකර ගැනීමට දීර්ඝ කාලීන බදු බලපත්‍රයක් මත මෙම ඉඩම ලබාගැනීමට කටයුතු කර ඇති බවත්;

(ii) ඒ සඳහා මෙම අනවසර භුක්තිය බාධාවක් වී ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මෙම ඉඩමේ අනවසර පදිංචිකරු ඉවත්කර බරවර්ධනඔය එක්සත් සුභ සාධන සමිතිය වෙත මෙම ඉඩම ලබා දීමට එතුමා අවශ්‍ය පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0358/'08

9.

ගරු රංජිත් අලුවිහාරේ මහතා,— ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) හපුතලේ මැතිවරණ කොට්ඨාසයේ නිකපොත, බෙරගල, පහල බිලැක්වුඩ්ගම එස්. කේ. ආරියරත්න මහතා විසින් "මිරිදිය" නමින් සංචාරක ව්‍යාපාරයක් ලෙස විසිතුරු මත්ස්‍ය සහ මල් අලෙවිසැලක් පවත්වාගෙන ගිය අක්කර 2 1/2 ක් පමණ වූ ඉඩම හල්දුම්මුල්ල ප්‍රාදේශීය ලේකම් විසින් පවරාගෙන නැවත වෙනත් අයෙකුට පවරාදීමට කටයුතු කර ඇති බව එතුමා දන්නෙහිද?

(ආ) (i) අසාධාරණ ලෙස මෙම ඉඩම පවරාගෙන එහි ඉදිකර තිබූ ගොඩනැගිලි සහ විසිතුරු මත්ස්‍ය වගාව හා මල් වගාව විනාශ කර ඇති බවත්;

(ii) සංචාරක ව්‍යාපාරයක් කර ජීවත් වූ මොහු ඉතා අසරණ තත්ත්වයකට පත්ව ඇති බවත්;

එතුමා පිළිගන්නෙහිද?

(ඇ) මොහුගේ ඉහත සංචාරක ව්‍යාපාරය නැවත කරගෙන යාම සඳහා මෙම ඉඩම ආපසු ලබාදීමට එතුමා පියවර ගන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

0494/'08

10.

ගරු විජිත හේරත් මහතා,—කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු වාහන කොපමණ සංඛ්‍යාවක් බාහිර පාර්ශවයන් වෙත මුදාහැර තිබේද;

(ii) එම වාහනවල වර්ගය, අංකය සහ මුදාහල දිනය කවරේද;

(iii) කවර ආයතනයක් හෝ පුද්ගලයන් වෙත කවර පදනමක් මත මුදාහැර තිබේද;

(iv) අනුයුක්ත කිරීමක් සිදුකර තිබේනම් ඔවුන්ගේ නම හා තනතුර කවරේද;

(v) එම වාහන මුදාහැරීමට නිසි අනුමතියක් ලබා තිබුණේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සතු ගොඩනැගිලි බදු හෝ කුලී පදනමින් බාහිර පාර්ශ්වයන් වෙත ලබා දී තිබේද;

(ii) එකී ගොඩනැගිලි පිහිටි ස්ථානයන්හි ලිපිනය සහ අදාළ බදු හෝ කුලී පදනම කවරේද;

(iii) ලබා දී ඇති ආයතන හෝ පුද්ගලයින්ගේ නම සහ ලිපිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0495/'08

11.

ගරු විජිත හේරත් මහතා,— කෘෂිකර්ම සංවර්ධන හා ගොවිජන සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය යටතේ ඇති පරිපාලිත සමාගම් සංඛ්‍යාව කොපමණද;

(ii) එම එක් එක් සමාගම පිහිටුවීමේ අරමුණ කවරේද;

(iii) එම එක් එක් පරිපාලිත සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ කාර්ය මණ්ඩලයේ නම, තනතුර, වැටුප් සහ බඳවාගත් පදනම කවරේද;

(iv) එම සමාගම් වෙත ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය මගින් ලබා දී ඇති විවිධාකාර මූල්‍ය පහසුකම්, වාහන, යන්ත්‍ර, ගොඩනැගිලි සහ වෙනත් පහසුකම් වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ආ) (i) ඉහත පරිපාලිත සමාගම් වලින් අපේක්ෂිත අරමුණු ඉටුවන්නේද; සහ

(ii) එම සමාගම්, වාර්ෂික ගිණුම් විධිමත් පරිදි පවත්වා ගනිමින් යහපත් මූල්‍ය විනයක් පවත්වාගෙන යන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහි ද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0496/'08

12.

ගරු විජිත හේරත් මහතා,— වාරිමාර්ග හා ජල කළමනාකරණ අමාත්‍යතුමා සහ වරාය හා ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) ශ්‍රී ලංකා නැව් ඉඩ පහසුකම් වෙන්කිරීමේ මධ්‍යම කාර්යාංශයේ (මධ්‍යම නැව් ගාස්තු කාර්යාංශයේ) නාවික සංවර්ධන අරමුදල සඳහා විවිධ නැව් නියෝජිතයන්ගේ කොමිස් මුදල් වශයෙන් අයවිය යුතු, එහෙත් 2002 වර්ෂයේ සිට මේ දක්වා හිඟ ව පවතින මුදල් ප්‍රමාණය කොපමණද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) එම මුදල් අයවිය යුතු ව තිබෙන නැව් නියෝජිතයින්ගේ නම, ලිපිනය සහ අදාළ මුදල කොපමණද යන්න සවිස්තරව එතුමා මෙම සභාවට ඉදිරිපත් කරන්නෙහිද?

(ඇ) නාවික සංවර්ධන අරමුදල සතු මුදල්, පෙර වර්ෂ වලදී රජයේ හෝ වෙනත් සංවිධාන වෙත මාරුකර තිබුණේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) එසේ නම් එම මුදල, අදාළ දිනයන් සහ ඒ කවර පදනමක් මතද යන්න එම සංවිධානවල නමට අදාළව එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0518/'08

13\.

ගරු ගාමිණී ජයවික්‍රම පෙරේරා මහතා,— විදුලිබල හා බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ලංකා විදුලිබල මණ්ඩලයේ පාරිභෝගික සේවා ලබාදීමේ දී අවශ්‍ය වන විදුලි මීටර්වල හිඟයක් පවතින බව එතුමා දන්නෙහිද?

(ආ) (i) එවැනි විදුලි මීටර් හිඟයක් ඇතිවීමට හේතු කවරේද;

(ii) එම විදුලි මීටර් හිඟය ආරම්භ වූයේ කවර වසරක සිටද;

(iii) මේ නිසා විදුලිය ලබාගැනීමට සිටින පාරිභෝගිකයිනට සිදුවන අපහසුතාවයන් මඟහැරීමට ගනුලබන ක්‍රියාමාර්ග කවරේද;

(iv) ලංකා විදුලිබල මණ්ඩලය වෙත විදුලි මීටර් ආනයනය කරන සමාගම් හා රටවල් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත ප්‍රතිපාදන වලින් ලබාදෙන විදුලි යෝජනා ක්‍රම විවෘත කිරීමේදී ද මෙම මීටර් හිඟය හේතුවෙන් අදාළ විවෘත කිරීම් ප්‍රමාද කිරීමට සිදුවන බව එතුමා පිළිගන්නෙහිද?

(ඈ) මෙම ප්‍රමාද කිරීම් වැළැක්වීමට අදාළ අමාත්‍යාංශ මට්ටමින් ගතහැකි ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඉ) නොඑසේ නම්, ඒ මන්ද?

0731/'08

14\.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— වෘත්තීය හා කාර්මික පුහුණු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නුවරඑළිය දිස්ත්‍රික්කයේ අඹගමුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැටන් නගරය අසල ඉදිකර ඇති "තොණ්ඩමන් වෘත්තීය පුහුණු මධ්‍යස්ථානය" අදාළ අමාත්‍යාංශයට අයත්වේද;

(ii) එසේනම් එය ඉදිකරන ලද වර්ෂය කවරේද;

(iii) ඒ සඳහා වැයකර ඇති මුලු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) අදාළ මධ්‍යස්ථානය ආරම්භයේ සිට මේ දක්වා තාක්ෂණික පුහුණුව සඳහා බඳවා ගෙන ඇති සිසුන් සංඛ්‍යාව කොපමණද;

(ii) මේ වනවිට අදාළ ආයතනය වසා දමා ඇත්තේ කවර හේතුවක් නිසාද;

(iii) එය විවෘත කිරීමට අදාළ අමාත්‍යාංශය මගින් කිසියම් හෝ ක්‍රියාමාර්ගයක් ගෙන තිබේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

0732/'08

15.

ගරු එන්. ඩී. එන්. පී. ජයසිංහ මහතා,— ජාතිය ගොඩනැගීමේ හා වතු යටිතල පහසුකම් සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,—(1)

(අ) (i) හඟුරන්කෙත සමෘද්ධි බැංකු 10 මගින් "දියතිලක ඇපරල්" නමින් වන ඇඟලුම් කම්හල ආරම්භ කිරීමට ණය ලබාදී ඇති පිරිස කොපමණද;

(ii) එම ණයලාභීන්ගේ නම් හා ලබාගත් ණය මුදල කොපමණද;

(iii) අදාළ ඇඟලුම් කම්හලේ ආරම්භක නිලධාරීන් හා සේවක සංඛ්‍යාව කොපමණද;

(iv) ඔවුන්ගේ වැටුප් හා දීමනා වෙන් වෙන් වශයෙන් කවරේද;

(v) ඉදිකිරීම් හා යන්ත්‍ර මිලදී ගැනීම සඳහා වැයකර ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ඉහත ඇඟලුම් කම්හල පසුකාලයේ වෙනත් අයෙකුට විකුණා ඇති බව එතුමා දන්නෙහිද?

(ඇ) (i) එසේ නම් එය විකුණා ඇත්තේ කවර මිලකටද;

(ii) විකුණා ලත් මුදල සමෘද්ධි බැංකු වලින් ගත් ණය පියවීම සඳහා යෙදවූයේද;

(iii) තවදුරටත් ගෙවීමට ඇති මුදල හා අදාළ ගෙවීම් අඛණ්ඩව සිදුවන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

---

# යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

1.

ගරු රවි කරුණානායක මහතා,— ජනාධිපතිවරයා සහ අගමැතිවරයා අමාත්‍ය ධුරයන් දැරීමෙන් වැළැක්වීම,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2007 ජූලි 06) "ඉතා ඵලදායී පරිපාලනයක් පවත්වාගෙන යාමටත්, තම ඇමතිවරුන්ගේ කටයුතු නිසි ලෙස සමාලෝචනය කිරීමටත් ජනාධිපතිවරයා හා අගමැතිවරයා කිසිදු අමාත්‍ය ධුරයක් නොදැරිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි" යනුවෙන් යෝජනා කරන ලදින්, ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී. [පා. 3/'05]

පා. 1/'08

2.

ගරු රවි කරුණානායක මහතා,— අවි ආයුධ ලියාපදිංචි කිරීම,— ශ්‍රී ලංකාවේ පවතින සියලුම අවි ආයුධ ලියාපදිංචි කළ යුතු අතර, එසේ ලියාපදිංචි කිරීමෙන් අනතුරුව යම් කිසිවෙකු ලියාපදිංචි නොකළ ආයුධයක් ළඟ තබා ගෙන අසුවුවහොත්, අපරාධ නීතිය උල්ලංඝණය කිරීමේ වරද යටතේ ඔහුට එරෙහිව නඩු පවරා, අවුරුදු 20 ක අනිවාර්ය සිර දඬුවමකට යටත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 2/'08

3.

ගරු රවි කරුණානායක මහතා,— බැංකු ගනුදෙනු වේලාවන් දීර්ඝ කිරීම,— රටේ ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීම සඳහා බැංකු ගණුදෙනු වේලාවන් පැය 9.00 සිට පැය 16.00 දක්වා දීර්ඝ කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 3/'08

4.

ගරු රවි කරුණානායක මහතා,— කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීම,— රිසි සේ මත්පැන් විකිණීම මෙරට සදාචාරාත්මක වටිනාකම් පිරිහීමට හේතු වී ඇති බැවින්, කෝට්ටේ ඡන්ද කොට්ඨාසය තුළ පවතින සියලුම තැබෑරුම් වසා දැමීමට නීති පැනවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 4/'08

5.

ගරු රවි කරුණානායක මහතා,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ (COPE), රාජ්‍ය ගිණුම් කාරක සභාවේ (PAC) සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට සහභාගි වීමට මාධ්‍යවේදීන්ට අවසර ලබාදීම,— පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාවේ, රාජ්‍ය ගිණුම් කාරක සභාවේ සහ උපදේශක කාරක සභාවල රැස්වීම්වලට මාධ්‍යවේදීන්ගේ සහභාගිත්වය තුළින් එම සාකච්ඡා වඩාත් ඵලදායී, අර්ථවත් හා විනිවිදභාවයකින් යුක්ත වනු ඇති බැවින් මාධ්‍යවේදීන්ට එම රැස්වීම්වලට සහභාගි වීමට අවසර දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 5/'08

6.

ගරු රවි කරුණානායක මහතා,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට කෘෂිකාර්මික ණය ලබා දීම,— කෘෂිකාර්මික ස්වයං රැකියාවල නියුතු ගොවීන්ට 5% ක අඩු පොළී අනුපාතයක් මත රු. 250,000 උපරිමයකට යටත්ව කෘෂිකාර්මික ණය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 6/'08

7.

ගරු රවි කරුණානායක මහතා,— පොලිතින්, ප්ලාස්ටික් ආදී අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කිරීම,— දිවයිනේ පොලිතින් හා ප්ලාස්ටික් ද්‍රව්‍ය භාවිතය සීඝ්‍රයෙන් වැඩි වී ඇති අතර, ඒවා අනිසි ලෙස බැහැර කිරීමෙන් මහා පරිමාණයෙන් පරිසර දූෂණය සිදුවන බැවින් එවැනි අපද්‍රව්‍ය ඉවත් කිරීම පිළිබඳව ජනතාව දැනුවත් කිරීම සඳහා දීප ව්‍යාප්ත වැඩ සටහනක් ක්‍රියාත්මක කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 7/'08

8.

ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය බැංකු වලින් ලබා ගත් ණය පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම,— රාජ්‍ය බැංකුවලින් රුපියල් මිලියන 100කට අධික ණය ලබා ගෙන ආපසු ගෙවීම පැහැරහරින්නන්ගේ නම් ප්‍රසිද්ධියට පත් කිරීම සඳහා නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 8/'08

9.

ගරු රවි කරුණානායක මහතා,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ක්‍රියාත්මක කිරීම,— පෞද්ගලික මන්ත්‍රීන්ගේ යෝජනා ඵලදායී ක්‍රමයක් වන අයුරින්, ඒවා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබීමෙන් පසු වසරක් තුල විවාදයට භාජනය කළ යුතු බවත්, ඒවා සභා සම්මත වුවහොත්, හය මාසයක් තුළ අමාත්‍ය මණ්ඩලය විසින් ද අනුමත කළ යුතු බවත් මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 9/'08

10.

ගරු රවි කරුණානායක මහතා,— පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කිරීම,— දිවයින තුළ ජාතික මමත්වයක් වර්ධනය කිරීමට හැකිවනු වස් පාර්ලිමේන්තුවේ රැස්වීම ආරම්භ කිරීමට හා අවසාන කිරීමට පෙරාතුව පාර්ලිමේන්තුව තුළ ජාතික ගීය වාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 10/'08

11.
ගරු රවි කරුණානායක මහතා,— බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීම,— ආණ්ඩුවේ ලිපිලේඛනාදියෙහි යම් කෙනෙකුගේ ජාතිය හා ආගම සඳහන් කිරීම අවශ්‍ය කරුණක් වීම බලගතු ශ්‍රී ලාංකික අනන්‍යතාවයක් ගොඩනැගීමට බාධාවක් හා අවහිරයක් වී ඇති බැවින් එම අවශ්‍යතාවය ඉවත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 11/'08

12.
ගරු රවි කරුණානායක මහතා,— වාණිජ අරමුණු සඳහා ආගමික නායකයින්ගේ රූප භාවිතා කිරීම වැළැක්වීම,— සියලුම ආගම්වලට සමානව ගරු කළ යුතු අතර කිසිදු වෙළෙඳ දැන්වීමක හෝ වෙනත් ආගමික නොවන භාණ්ඩයක බුදුරජාණන් වහන්සේගේ, ජේසුස් ක්‍රිස්තුස් වහන්සේගේ, ශිව දෙවියන්ගේ සහ මහම්මත් නබිතුමන්ගේ රූප ඇතුලත් නොකළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 12/'08

13.
ගරු රවි කරුණානායක මහතා,— අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කිරීම,— සියලු දෙනාටම සමාන සාධාරණත්වයක් සහතික කරනු වස් ශක්තිමත් ප්‍රජාතන්ත්‍රවාදයක් සහ උද්දීප්තිමත් නිදහස් මාධ්‍යයක් පවත්වාගෙන යාම සඳහා අධිකරණයට අපහාස කිරීම පිළිබඳ කාර්ය පටිපාටිය විධිමත් කිරීමට නව නීති සකස් කළයුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 13/'08

14.
ගරු රවි කරුණානායක මහතා,— මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වාදීම,— දිළිඳු ජනතාවගේ මූලික මිනිස් අයිතිවාසිකම් කඩවීම, රාජ්‍ය ප්‍රතිපත්ති වල අඩංගු දේ හෝ ඒවායේ බලපෑම, පොදු කටයුතු ඉටු කිරීමට නාගරික අධිකාරයන්ට බලපෑම් කිරීම, ආගමික අයිතිවාසිකම් හෝ අනෙකුත් මූලික අයිතිවාසිකම් කඩවීම සහ අධික මහජන ණය හා පුරවැසියන් අතිරේක වගකීම් වලට යොමු කැරෙන දූෂණය යන කරුණු සම්බන්ධයෙන් මහජන යහපත උදෙසා නඩුකරණයට නීති හඳුන්වා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 14/'08

15.
ගරු රවි කරුණානායක මහතා,— දේශපාලන පක්ෂ විසින් මැතිවරණ කොමිෂන් සභාවට මූල්‍ය විගණන වාර්තාවක් ඉදිරිපත් කිරීම,— සියලුම පිළිගත් දේශපාලන පක්ෂ විසින් උපයාගත් ආදායම් හා දැරූ වියදම් විගණනයට භාජනය කළ යුතු හා මැතිවරණ කොමිෂන් සභාවට ඉදිරිපත් කළ යුතු යයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 15/'08

16.
ගරු රවි කරුණානායක මහතා,— රාජ්‍ය නිලධාරීන්ට දඬුවම් පැමිණවීම,— රජයේ උසස් නිලධරයන් තම ස්වාධීන නිලය දේශපාලනීකරණය කරන්නේ නම් හා අයථා ලෙස යොදා ගන්නේ නම්, එයින් වැරදිකරුවන් බව ඔප්පු වූ වහාම ඔවුන්ට දඬුවම් පැමිණවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 16/'08

17.
ගරු රවි කරුණානායක මහතා,— විශ්‍රාම ගැන්වීමේ වයස් සීමාව දීර්ඝ කිරීම,— රාජ්‍ය නිලධාරීන්ගේ විශ්‍රාම ගැන්වීමේ වයස අවුරුදු 65 දක්වා වැඩි කළ යුතු යැයිද, ව්‍යවස්ථාදායකය විසින් නිර්දේශ කරනු ලැබුවහොත් විශේෂ කුසලතා ඇති නිලධාරීන් සඳහා එය අවුරුදු 70 දක්වා දීර්ඝ කළ හැකි යැයි ද මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 17/'08

18.
ගරු රවි කරුණානායක මහතා,— අධ්‍යාපනය ආරක්ෂා කිරීම සඳහා තත්ත්ව ආරක්ෂණ සභාවක් නීතිගත කිරීම,— වගකීමකින් තොරව විශ්වවිද්‍යාල නාමයන් භාවිත කරමින් ශ්‍රී ලංකාව තුළ විශාල වශයෙන් අධ්‍යාපනික ආයතන බිහිවෙමින් පවතින නිසා, අධ්‍යාපනය අනාගත පරම්පරාව සඳහා ආරක්ෂා කර දීම උදෙසා " තත්ත්ව ආරක්ෂණ සභාවක්" නීතිමය වශයෙන් වහා ස්ථාපිත කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 18/'08

19.
ගරු රවි කරුණානායක මහතා,— "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් තනතුරක් ඇති කිරීම,— රාජ්‍ය සේවය දේශපාලන බලපෑම් වලින් තොර බවට සහතික කරනු වස්, ආයතනවල ගුණාත්මකභාවයට බලපාන ලෙස සිදු කළ අයථා පරිහරණයන්, දූෂණයන් හෝ අකාර්යක්ෂමතාවයන් පිළිබඳ සිද්ධීන්, ස්වාධීන කොමිසම්, රාජ්‍ය ගිණුම් කාරක සභාව සහ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව මගින් වාර්තා කළ වහාම ඒ සම්බන්ධ පැමිණිලි මෙහෙයවන, පාර්ලිමේන්තුවට සෘජුවම වාර්තා කරනු ලබන තනතුරක්, "විශේෂ පැමිණිලි මෙහෙයවන්නා" යන නාමයෙන් ඇති කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 19/'08

20.
ගරු රවි කරුණානායක මහතා,— අයවැය සම්මත කිරීමට පෙර පූර්ව අයවැය විවාදයක් පැවැත්වීම,—ඉන්දියාව හා එක්සත් රාජධානිය මෙන් අවසාන හා පූර්ණ අයවැය සම්මත කිරීමට මාස තුනකට ප්‍රථම, අයවැය ඇස්තමේන්තුවල අහිතකර හෝ අවාසිදායක බලපෑම් ඇතොත් ඒවා අවම කිරීමට සහ නිවැරදි කිරීමට හැකි වන පරිදි පූර්ව අයවැය විවාදයක් පැවැත්විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 20/'08

21.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ කෞතුකාගාරයක් පිහිටුවීම,— කෑගල්ල දිස්ත්‍රික්කය තුළ ඇති පෞරාණික, සංස්කෘතික, සමාජමය වටිනාකමක් ඇති ස්ථානවල තොරතුරු ලබා ගත හැකි හා කෞතුක භාණ්ඩ සඳහා කෞතුකාගාරයක් පිහිටුවීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 21/'08

22.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික ප්‍රතිපත්ති තීරණය කිරීම සඳහා ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පත් කිරීම,— ක්‍රමවත් ජාතික ප්‍රතිපත්ති හා සැලසුම් නිර්මාණය කිරීම සඳහා දේශපාලනඥයන්ගෙන් හා විෂය බද්ධ වෘත්තීයවේදීන්ගෙන් සමන්විත ආණ්ඩු මාරුවීම් අනුව වෙනස් නොවන නිශ්චිත බලයක් සහිතවූත් ජාතික ප්‍රතිපත්ති සැලසුම් සභාවක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 22/'08

23.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— විදේශ රැකියා නියුක්තිකයන්ගේ ගැටළු නිරාකරණය කිරීම සඳහා නීතිමය බලතල සහිත ඒකකයක් පිහිටුවීම,— විදේශ රැකියාවන්හි නියුක්ත වූවන්ට සිදුවන පහරදීම්, පැහැරගෙන යෑම්, ස්ත්‍රී දූෂණ, ස්ත්‍රී අපචාරයෙහි යෙදවීම්, මිනීමැරීම් හා විදේශගත වීමේදී සිදුවන මුදල් වංචා කිරීම් හා විදේශගත වී අනාථ වූවන් නැවත ගෙන්වා ගැනීම හා ඔවුන්ගේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලිය හැකි නීතිමය බලතල ඇති ඒකකයක් පිහිටුවිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 23/'08

24.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— නව නිපැයුම්කරුවන්ගේ නිර්මාණ ලෝකයට හඳුන්වා දීම සඳහා ජාතික වැඩ පිළිවෙළක් සකස් කිරීම,— නව නිපැයුම්කරුවන් ඇතුළු විවිධ දක්ෂතා ඇති පුරවැසියන්ට තම නව නිපැයුම් ලෝකයට හඳුන්වාදීම සඳහා ද ඔවුන් සතු දක්ෂතා හා එකී නිර්මාණ දියුණු කර ගැනීම සඳහා ද ජාතික වැඩපිළිවෙලක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 24/'08

25.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශීය අමු ද්‍රව්‍ය යොදා ගන්නා කර්මාන්තකරුවන්ට බදු සහන ලබා දීම,— සම්පූර්ණයෙන් ජාත්‍යන්තර වෙළඳපොල සඳහා ඉලක්ක කර ගනිමින් 75% කට වඩා දේශීය අමුද්‍රව්‍ය යොදා ගනිමින් භාණ්ඩ නිපදවන දේශීය කර්මාන්තකරුවන්ට අවුරුදු 02ක බදු සහන කාලයක් ලබා යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 25/'08

26.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අධිකරණය, පොලීසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීම,— සමාජයෙහි ව්‍යාප්තව යමින් පවතින අපරාධ අඩු කිරීමත්, අපරාධ නීති පද්ධතියේ පවතින අඩුපාඩු අඩුකර අපරාධ නීතිය සංශෝධනය කිරීමත් අධිකරණය තුළ ගොඩගැසී ඇති ඉඩම් නඩු ඇතුළු නඩු විභාග අවසන් කිරීම හා අධිකරණය, පොලිසිය හා බන්ධනාගාර නවීකරණය කර කඩිනම් සේවයක් ලබා දීම සඳහාත් අධිකරණය, පොලිසිය, බන්ධනාගාරය ඒකාබද්ධ වන අයුරින් ජනාධිපති කොමිසමක් පත් කිරීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 26/'08

27.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— වතුකර ජනතාවට පුරවැසිකම් ලබාදීම,— වතුකරයේ ශ්‍රී ලංකා පුරවැසිකම නොමැති සියලු ජන කොට්ඨාසවලට ඔවුන්ගේ කැමැත්ත මත පුරවැසිභාවය ලබා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 27/'08

28.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දිවයිනේ ප්‍රාථමික පාසැල් දරුවන්ට නොමිලේ කිරි වීදුරුවක් ලබා දීම,— දිවයිනේ සියලු ප්‍රාථමික පාසැල් දරුවන්ට උදෑසන නොමිලයේ කිරි වීදුරුවක් ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 28/'08

29.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— සේවක අර්ථසාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දීම,— සේවක අර්ථ සාධක අරමුදල් හා සේවා නියුක්ති භාරකාර අරමුදල් සතියක් ඇතුළත ඉල්ලුම්කරුවන්ට ලබා දිය හැකි වැඩපිළිවෙළක් සකස් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 29/'08

30.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත් කිරීම,— රාජ්‍ය සංස්ථා, මණ්ඩල, අධිකාරි ඇතුලු ව්‍යවස්ථාපිත ආයතනවල සභාපතිවරුන් හා අධ්‍යක්ෂ මණ්ඩල පත්කිරීම සඳහා වෘත්තීමය සුදුසුකම් හා පලපුරුද්ද ඇති පුද්ගලයන් පමණක් තෝරා ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 30/'08

31.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන්හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කිරීම,— දිවයින පුරා නැවත සමීක්ෂණයක් කර ග්‍රාම නිලධාරි වසම්, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා පරිපාලන ප්‍රදේශයන් හි සීමාවන් විද්‍යාත්මක පදනමක් මත යළි නිර්මාණය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 31/'08

32.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කිරීම,— ශ්‍රී ලංකා විදේශ සේවයට නිලධාරීන් බඳවා ගැනීමේ දී සීමිත තරග විභාග ලකුණු මත පමණක් තීරණය කර සම්මුඛ පරීක්ෂණයේදී මූලික සුදුසුකම් පිළිබඳව පමණක් සොයා බැලීමට පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 32/'08

33.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම,— අපරාධ කරන පාර්ශ්වයට දඬුවම් දීම හා ඉන් හානියට පත් වන පාර්ශ්වයට වන්දි ලබා දීම එකම අධිකරණයක් තුළ දී කළ හැකි වන අයුරින් නීති සම්පාදනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 33/'08

34.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— පාසැල් ළමුන් සඳහා නිදහස් වාර ගමන් ප්‍රවේශ පත්‍ර ලබා දීම,— පාසැල් ළමුන්ට මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ බස් රථවල ගමන් කිරීම සඳහා නිදහස් වාර ප්‍රවේශපත් ක්‍රමයක් හඳුන්වාදීමට මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 34/'08

35.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— දේශපාලන පළිගැනීම්වලට ලක් වූවන්ට සහන සැලසීම සඳහා ජනාධිපති කොමිසමක්,— අතීතයේ සිට මේ දක්වා ජනතාව තමන් දරන දේශපාලන මතය නිසා පීඩාවට හා දේශපාලන පළිගැනීම්වලට ලක් වූ අයගේ පැමිණිලි විභාග කර සහන සැලසිය හැකි පූර්ණ බලැති ජනාධිපති කොමිසමක් පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 35/'08

36.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ක්‍රීඩා පාසැල් ඉදිකිරීම හා ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීම,— දිගුකාලීන ඉලක්කයක් සහිත ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් හා වැඩ පිළිවෙළක් සකස් කිරීම උදෙසා මූලික වශයෙන් සෑම දිස්ත්‍රික්කයක්ම ආවරණය වන පරිදි ක්‍රීඩාගාර, පිට්ටනි, උපකරණ හා ක්‍රීඩා උපදේශකයන්ගෙන් සමන්විත උසස් ගණයේ ක්‍රීඩා පාසැල් ඉදි කිරීමටත් ජාතික ක්‍රීඩා ප්‍රතිපත්තියක් සකස් කිරීමටත් මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 36/'08

37.
ගරු ආර්. එම්. ගාමිණී රත්නායක මහතා,— ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් පිහිටුවීම,— ගුරුවරුන්ට සිංහල, දෙමළ, ඉංග්‍රීසි භාෂා ඉගැන්වීම සඳහා ජාතික භාෂා අධ්‍යාපන මණ්ඩපයක් ස්ථාපිත කිරීමට මෙම පාර්ලිමේන්තුව අදහස් කරයි.

පා. 37/'08

38.
ගරු ලක්ෂ්මන් නිපුණආරච්චි මහතා,— විශ්‍රාමික පාරිතෝෂික මුදල් වහාම ලබා දීම,— මෙතෙක් විශ්‍රාමික පාරිතෝෂික මුදල් ලබා නොදුන් විශ්‍රාමිකයින්ට එම විශ්‍රාමික පාරිතෝෂික මුදල් ප්‍රමාදයකින් තොරව වහාම ලබා දීමට කටයුතු කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 38/'08

39.
ගරු විජිත රණවීර මහතා,— උස්සන්ගොඩ කඳුවැටිය පිහිටි භූමිය සංරක්ෂණය කිරීම,— ප්‍රාග් ඓතිහාසික යුගයේ මධ්‍යම පුරාශීලා යුගයට අයත් යැයි හඳුනාගෙන ඇති දකුණු පළාතේ අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් මුහුදු වෙරළ තීරයේ පිහිටා ඇති දකුණේ හෝර්ටන් තැන්න නමින් ප්‍රකට උස්සන්ගොඩ කඳුවැටිය පිහිටා ඇති භූමිය, ශ්‍රී ලංකාවේ විවෘත ජනාවාසයකින් අවුරුදු විසි අටදහසක් පැරණි ජ්‍යාමිතික ආයුධ හා පාෂාණ සොයාගත් භූමියක්

ලෙස ද, සාගර හා ගොඩබිම් ජෛව විවිධත්වය අතින් ඉතා පොහොසත් භූමියක් ලෙස ද, කදිම කැස්බෑ වාසස්ථානයක් ලෙස ද, සුනාමි රළ පහරින් ජනතාව ආරක්ෂා කළ පවුරක් ලෙස ද, අතිශය වටිනාකමක් උරුම කරගෙන ඇති හෙයින් එම භූමිය තුළ ආරම්භ කිරීමට යෝජිත ව්‍යාපෘති නවතා දමා වහාම සංරක්ෂණය කළ යුතු පරිසර පද්ධතියක් ලෙස ප්‍රකාශයට පත් කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 39/’08

40.
ගරු රවි කරුණානායක මහතා,— උද්ධමනයට ගැලපෙන සේ සේවා නියුක්තිකයන්ට 1%ක දීමනාවක් ගෙවීම,— රාජ්‍ය ආයතන විසින් පරිපාලනය කරනු ලබන සේවා නියුක්තිකයන්ගේ අර්ථසාධක අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල ගෙවීමේ දී එක් එක් වර්ෂයේ උද්ධමනය ප්‍රමාණයට වඩා 1%ක දීමනාවක් සේවා නියුක්තිකයන්ට ලබා දීමට සහතික විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 40/’08

41.
ගරු රවි කරුණානායක මහතා,— ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට නොමිලේ ගමන් පහසුකම් සැලසීම,— සියලුම ජ්‍යෙෂ්ඨ පුරවැසියන්ට පොදු ගමනාගමන සේවාවන්වල නොමිලේ ගමන් පහසුකම් සලසා දිය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 41/’08

42.
ගරු විජිත රණවීර මහතා,— 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කිරීම,— ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික කටයුතුවල නියැලෙන ගොවීන් සතු ඉඩම්වල අයිතිය විවිධ හිමිකම් යටතේ පවතින අතර ඉන් බොහෝ දෙනෙක් අද ගොවියන් වන හෙයින් ද, ඉහත පනත මගින් අද ගොවි ක්‍රමය අහෝසි කිරීමේ හේතුවෙන් අද ගොවීන් ගොවි බිම් වලින් නෙරපා දමා ඇති අතර නීතිමය රැකවරණයක් නොමැතිකමින් විවිධ ගැටුම්කාරී තත්ත්වයන් නිර්මාණය වෙමින් පවතින හෙයින් ද, අද ගොවීනට වූ එම අසාධාරණය දුරුලීම සඳහා 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත සංශෝධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

*43.
අධ්‍යාපන අමාත්‍යතුමා,— පරිපූරක මුදල — ශීර්ෂය 212— වැඩසටහන 2,—† 2008 ජනවාරි මස 01 වැනි දිනෙන් ආරම්භව 2008 දෙසැම්බර් මස 31 වැනි දිනෙන් අවසන් වන මුදල් වර්ෂය තුළ සේවා සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ වෙන කිසියම් අරමුදලකින් හෝ මුදල්වලින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ සුදුස්සක් කළ හැකිව තිබෙන මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය විසින් ලබාගන්නා කිසියම් ණය මුදලකින් හෝ රුපියල් හාරසිය හතළිස් එක් මිලියන අටසිය දහසකට (රු. 441,800,000) නොවැඩි පරිපූරක මුදලක් ගෙවිය යුතු අතර එම මුදල මෙහි පහත දක්වා ඇති උපලේඛනයෙහි නියමිත පරිදි වැය කළ යුතුය.

උපලේඛනය

| | | | | |
|---|---|---|---|---|
| ශීර්ෂය | 212 | — | ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව | |
| වැඩ සටහන | 2 | — | සංවර්ධන ක්‍රියාකාරකම් | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 441,800,000 |
| | | | ප්‍රාග්ධන වියදම් | රු. — |
| | | | එකතුව | රු. 441,800,000 |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

† 2008 අගෝස්තු මස 22 වැනි දින ඉදිරිපත් කරන ලද 2008 අංක 6 දරන පරිපූරක ඇස්තමේන්තුව බලන්න. පරිපූරක ඇස්තමේන්තු අංක 1 සිට 5 දක්වා එකතුව රුපියල් 15,070,180,332.

*44.
ජාතික නිවාස සංවර්ධන අධිකාරිය (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*45.
චීන සම්භවයක් ඇති තැනැත්තන්ට පුරවැසිභාවය ප්‍රදානය කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*46.
සිවිල් ගුවන් සේවා පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*47.
අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන්හට සහාය දීමේ සහ ආරක්ෂා කිරීමේ පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2008 ජුනි 17) [1]

*48.
ශ්‍රී ලංකා විදුලිබල පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*49.
ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (සංශෝධන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*50.
ප්‍රතාපන විරෝධී සහ ප්‍රතිතෝලන බදු පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04). [1]

*51.
බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18). [1]

*52.
අක්‍රිය වත්කම් (ආපසු අයකර ගැනීමේ) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*53.
සූදු (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ජූලි 18) . [1]

*54.
ආරක්ෂණ පියවර පනත් කෙටුම්පත — විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 අප්‍රේල් 04.) [1]

*55.
ආණ්ඩුකාරවරයන්ගේ විශ්‍රාම වැටුප් පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*56.
නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

*57.
ජාතික පේෂකර්ම හා ඇඟලුම් ආයතනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම

*58.

ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා,— ධීවර සහ ජලජ සම්පත් පනත යටතේ නියෝග,— 1996 අංක 2 දරන ධීවර සහ ජලජ සම්පත් පනතේ 61 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියේ (ඕ) සහ (ක) ඡේද යටතේ ධීවර සහ ජලජ සම්පත් අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2007 දෙසැම්බර් මස 17 දිනැති අංක 1528/7 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.08.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය.

*59.

නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා,— නාගරික සංවර්ධන අධිකාරිය පනත යටතේ නියෝග,— ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරිය පනතේ 21 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තිය යටතේ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යතුමා විසින් සාදන ලදුව, 2008 ජූනි මස 27 දිනැති අංක 1555/32 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.07.25 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතුය.

*60.

වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා තේ මණ්ඩල පනත යටතේ නියෝග,— 1975 අංක 14 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩල පනතේ 25 වැනි වගන්තියේ (උ) ඡේදය යටතේ, ශ්‍රී ලංකා තේ මණ්ඩලය විසින් සාදන ලදුව වැවිලි කර්මාන්ත අමාත්‍යතුමා විසින් අනුමත කරන ලද, 2008 ජනවාරි මස 10 දිනැති අංක 1531/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.04.09 වැනි දින ඉදිරිපත් කරන ලද "2008 අංක 1 දරන ශ්‍රී ලංකා තේ මණ්ඩලයේ ( තේ කර්මාන්ත ශාලා ඉදි කිරීම සහ ක්‍රියාත්මක කිරීම) අවම ප්‍රමිති නියෝග" අනුමත කළ යුතු ය.

*61.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— සුරා බදු ආඥා පනත යටතේ රීති,— (52 වැනි අධිකාරය වූ) සුරාබදු ආඥා පනතේ 32 වැනි වගන්තිය යටතේ අතිගරු ජනාධිපතිතුමා විසින් සුරාබදු සම්බන්ධයෙන් පනවන ලදුව, 2008 අප්‍රේල් මස 10 දිනැති අංක 1544/17 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2008.06.19 වැනි දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

*62.

වෛද්‍ය ආඥා පනත යටතේ නියෝග,— විවාදය කල් තබනු ලැබූ ප්‍රශ්නය (2006 ඔක්තෝබර් 03),— "(105 වැනි අධිකාරය වූ) වෛද්‍ය ආඥා පනතේ 72 වැනි වගන්තිය සමග කියවිය යුතු 19 වැනි වගන්තිය යටතේ සෞඛ්‍ය ආරක්ෂණ හා පෝෂණ අමාත්‍යතුමා විසින් ශ්‍රී ලංකා වෛද්‍ය සභාව විමසා සාදන ලදුව, 2006 අගෝස්තු මස 17 දිනැති අංක 1458/16 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2006.09.05 වැනි දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය." යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*63.

තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා,— තැපැල් කාර්යාල ආඥා පනත යටතේ ව්‍යවස්ථාව,— (190 වැනි අධිකාරය වූ) තැපැල් කාර්යාල ආඥා පනතේ අංක 12, 21, 25, 27, 81, 62, 06, 39, 49, 44, 68, 67, 40, 24, 59, 60, 35, 59, 67 හා 64 යන වගන්ති යටතේ තැපැල් හා විදුලි සංදේශ අමාත්‍යතුමා විසින් මුදල් අමාත්‍යතුමාගේ එකඟත්වය ඇතිව සම්පාදනය කරන ලදුව, 2007 අප්‍රේල් මස 25 දිනැති අංක 1494/10 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2007.07.17 වැනි දින ඉදිරිපත් කරන ලද ව්‍යවස්ථාව අනුමත කළ යුතු ය.

*64.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 1),— අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවනු ලබන මාසික දීමනාව සිය නිත්‍ය තනතුරේ මාසික වැටුපෙන් 1/3 කට සමාන මාසික දීමනාවක් විය යුතු

යැයි ද, එය 2007 ජනවාරි මස 01 වැනි දින සිට ගෙවිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ. අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්ගේ දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට, මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනාව ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*65.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ තීරණය (අංක 2),— 2002.01.28 වැනි දින රාජ්‍ය සේවයෙන් විශ්‍රාම ගනු ලැබූ මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දාහත්වැනි සංශෝධනයේ 27(2) වගන්තිය යටතේ 2002.01.29 වැනි දින සිට නැවත එම ධූරයට පත් කරන ලදුව, ඉන් අනතුරුව රාජ්‍ය සේවයේ කරන ලද වැටුප් සංශෝධනවලට අනුව මැතිවරණ කොමසාරිස්වරයාගේ වැටුප් 2006.11.23 වැනි දින පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරන ලද නමුත් ලේකම්වරුන්ගේ ව්‍යවස්ථාව යටතේ මෙම ධූරයට හිමි වාර්ෂික වැටුප් වර්ධක ගෙවීම සම්බන්ධයෙන් එම අවස්ථාවේ නිශ්චය නොකරන ලද හෙයින් මැතිවරණ කොමසාරිස් දයානන්ද දිශානායක මහතා නැවත එම ධූරයට පත් කළ 2002.01.29 වැනි දින සිට ධූරය දරන තාක් කාලයට හිමි වැටුප් වර්ධක අගයන් ද වැටුපට එකතු කොට වැටුප් ගෙවිය යුතුයැයි මෙම පාර්ලිමේන්තුව නිශ්චය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*66.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 1),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ පාරිශ්‍රමික හා දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 65,000.00 | මාසික |
| ඉන්ධන දීමනාව | - | රු. | 14,400.00 | මාසික |
| | එකතුව | රු. | 79,400.00 | |

සාමාජිකයින්

| | | | | |
|---|---|---|---|---|
| පාරිශ්‍රමිකය | - | රු. | 30,000.00 | මාසික |

තවද, වැඩි කරන ලද පාරිශ්‍රමිකයෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ පාරිශ්‍රමිකය 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමික හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද පාරිශ්‍රමික හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන පාරිශ්‍රමික හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*67.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ යෝජනාව (අංක 2),— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155 අ(1) ව්‍යවස්ථාව ප්‍රකාරව පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ දීමනා, 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

දීමනාව - රු. 65,000.00 මාසික

ඉන්ධන දීමනාව - රු. 14.400.00 මාසික

එකතුව රු. 79,400.00

සාමාජිකයින්

දීමනාව - රු. 30,000.00 මාසික

තවද, වැඩි කරන ලද දීමනාවෙන් (ඉන්ධන දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ දීමනාව 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ජාතික පොලිස් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*68.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ තීරණය,— 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනතේ 2(7) ඡේදය අනුව එම කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයින්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

වැටුප - රු. 66,000.00 මාසික

ඉන්ධන දීමනාව - රු. 14.400.00 මාසික

එකතුව රු. 80,400.00

සාමාජිකයින්

වැටුප - රු. 65,000.00 මාසික

ඉන්ධන දීමනා - රු. 12,000.00 මාසික

එකතුව රු. 77,000.00

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ සභාපති හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මෙයට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගෙන් නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

*69.

අග්‍රාමාත්‍යතුමා, අභ්‍යන්තර පරිපාලන අමාත්‍යතුමා සහ රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව, නීතිය හා සාමය පිළිබඳ නියෝජ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත යටතේ යෝජනාව,— 1996 අංක 21 දරන ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනතේ 8 වැනි වගන්තිය ප්‍රකාරව පිහිටුවන ලද ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිගේ සහ සාමාජිකයන්ගේ වැටුප් හා දීමනා 2006.01.01 දින සිට පහත සඳහන් පරිදි විය යුතු යැයි මෙම පාර්ලිමේන්තුව විසින් නිශ්චය කරනු ලැබේ.

සභාපති (පූර්ණ කාලීන)

වැටුප - රු. 65,000.00 මාසික

ඉන්ධන දීමනාව - රු. 14,400.00 මාසික

එකතුව රු. 79,400.00

සාමාජිකයින්

වැටුප - රු. 30,000.00 මාසික

තවද, වැඩි කරන ලද වැටුපෙන් (දීමනා හැර) 50%ක් 2006.01.01 දින සිට සහ ඉතිරි 50% සහිත සම්පූර්ණ වැටුප 2007.01.01 දින සිට ගෙවිය යුතු යැයි ද, ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ සභාපතිට හා සාමාජිකයන්ට ගෙවිය යුතු වැටුප් හා දීමනා සම්බන්ධයෙන් මීට පෙර පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවන්ගේ නිශ්චය කරන ලද වැටුප් හා දීමනා වෙනුවට මෙම යෝජනාවෙන් නිශ්චය කරනු ලබන වැටුප් හා දීමනා ආදේශ විය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව තවදුරටත් තීරණය කරයි.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය ලැබී ඇත.)

70.

දහනව වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

71.

උතුර සහ නැගෙනහිර දෙපළාත තාවකාලිකව ඒකාබද්ධ කිරීම අහෝසි කිරීමේ (විශේෂ විධිවිධාන) පනත් කෙටුම්පත — දෙවැනි වර කියවීම.

* **සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.**

---

**[1]**

" පනත් කෙටුම්පත දැන් දෙවැනි වර කියවිය යුතු ය" යනුවෙන් යෝජනා කරන ලදින් ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.